**2.10.1 :** නාට්‍යයට උචිත සංගීතය නිර්මාණය කරයි.

නාට්‍ය ගීත

වේදිකා නාට්‍යක සංගීතය ආහාර්ය අභිනයට අයත් අනුශාංගික කලාවක් වුවද, නාට්‍ය ගීත අයත් වන්නේ වාචික අභිනයටය. එයට හේතුව වනුයේ නාට්‍ය ගීත ගායනා සිදු කරනු ලබන්නේ රඟන නළුනිලියන් විසින් වීමය.

නාට්‍යක නාට්‍ය ගීත බොහෝ අවස්ථා වලදී නාට්‍ය රචකයා විසින් නාට්‍ය පෙළට රචනා කරනු ලබන අතර ඇතැම් අවස්ථාවලදී නාට්‍ය රචනයෙන් පසුව නිෂ්පාදන ක්‍රියාවලියේදී එකතු වූ අවස්ථා ද දක්නට ඇත.

වේදිකා නාට්‍යයවල නාට්‍ය ගීත සඳහා සුවිශේෂී ස්ථානයක් හිමිවී ඇත.වේදිකා නාට්‍යවල ඇති ඇතැම් නාට්‍ය ගීත එම වේදිකා නාට්‍යෙය් නම,කතා වස්තුවට වඩා ප්‍රේක්ෂකයා අතර ජනප්‍රියව පවතී.

සාමාන්‍ය සරළ ගීත වලට වඩා නාට්‍ය ගීත සුවිශේෂ වීමට හේතුවක් ලෙස නාට්‍ය ගීත ගායනයේදී වාචික අභිනය පමණක් නොව ආංගික අභිනය හා සාත්වික අභිනය බහුලව යොදා ගැනීම දැක්විය හැක.එසේම නාට්‍ය ගීත ගායනයේදී චරිත රඟන නළු නිලියන් පමණක් නොව ගායක පිරිස ,පොතේගුරු විසින් ගායනාවන්ට සහය වීම තවත් විශේෂ ලක්ෂණයකි.එය නාට්‍ය ධර්මී නාට්‍ය වල බහුලව දක්නට ලැබේ.

නාට්‍ය ශෛලිය අනුව නාට්‍ය ගීත ගායනයේ වෙනස්කම්ද දක්නට ලැබේ.නාට්‍ය ධර්මී නාට්‍ය වල දෙබස් උච්චාරනය සිදු කරන්නේද කිසියම් රිද්මයකට අනුව ගායනා ස්වරූපයකිනි.(මනමේ,සිංහබාහු )

පැවරුම්

**1.**නාට්‍ය ගීතයක් සරළ ගීතයක් අතර වෙනස්කම් දක්වන්න.

**2.**ශ්‍රී ලාංකේය වේදිකා නාට්‍ය ඉතිහාසය තුල ගැයුනු නාට්‍යගීත සොයා එම ගීත ඇතුලත් කර පොතක් සකස් කරගන්න.

( අන්තර් ජාලය භවිතා කරමින් නාට්‍ය ගීත පරිශීලනය කරන්න )

ගූගල් සෙවුම භාවිතා කරමින් **Top sinhala mp3** ලෙස ටයිප් කර පරීක්ෂා කරන්න.එහි ඇති ප්‍රධාන මෙනුවේ නාට්‍ය ගීත මෙනුවට ගිය විට නාට්‍ය ගීත ශ්‍රවණය කිරීමට හෝ ඩවුන්ලොඩ් කිරීමට හැකියාව ඇත.

**3.**නාට්‍ය ගීත නිතර තිතර ශ්‍රවණය කිරීමට හුරුවන්න.එම ගීත ශ්‍රවණය කරන අතරතුර ශබ්ද නගා තාලයට ගායනා කරන්න.